CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்

No 160G, Poorwarama Road, Kirulapone. **Tel:** +94 11 2826388/+94 11 2826384
**Fax**: +94 11 2826146 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

# වර්ෂ 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන ලෙසට මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉල්ලා සිටී

මේවන විට කොවිඩ්-19 වෛරස් වසංගතය මෙරට තුල පැතිරෙමින් පවත්නා තත්ත්වය සැලකිල්ලට ගනිමින්, අප්‍රේල් මස 25 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන මෙන් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (මැ.ප්‍ර.නි.ම), මැතිවරණ කොමිෂන් සභාවෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනු ලැබේ.

මැතිවරණය පැවැත්වීම සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම් බොහොමයක් ඔස්සේ විශාල පිරිසක් එකිනෙකා හා සමීපව ගැටෙන අන්දමට කටයුතු කිරීමට සිදුව තිබීම හේතුවෙන් එම තත්ත්වය මෙම වෛරසය පැතිරයාමට හේතුවක් වේ. මෙකී පුද්ගලයන් අතරට, රට පුරා පිහිටුවවීමට නියමිත ඡන්ද මධ්‍යස්ථානයන්හි හා ඡන්ද ගණන් කිරීමේ මධ්‍යස්ථානයන්හි ඉතා සමීපව කටයුතු කිරීමට සිදුවන දහස් ගණනක් වූ මැතිවරණ රාජකාරියෙහි නියැලෙන නිලධාරීන්, දේශපාලන පක්ෂ ක්‍රියාකාරීන්, පොලිස් නිලධාරීන් සහ මැතිවරණ නිරීක්ෂණ සංවිධානයන්හි සාමාජිකයින්; ඡන්දය සලකුණු කිරීමට ඡන්දදායකයින් පැමිණීමේදී ඔවුන් ඡන්ද පත්‍රිකාව ලබාදෙන අවස්ථාවේ ඇඟිලි මත වර්ණ අලේපනය කිරීමේදී මැතිවරණ නිලධාරීන් සහ ඡන්දදායකයින් අතර ඇතිවන ශාරීරික ස්පර්ෂය සහ එවන් වූ ඡන්ද පත්‍රිකාවක් ඡන්ද ගණන්කිරීමේ ක්‍රියාවලියෙහිදී මැතිවරණ නිලධාරීන් බොහෝ දෙනෙකු අතර හුවමාරු වීම ආදී තත්ත්වන් ඇතුලත් වේ. තවද මහජන රැළි සහ රැස්වීම් ද ඇතුළු මැතිවරණ ව්‍යාපාරය හා සබැඳි බොහෝ ක්‍රියාකාරකම් මඟින් ද විශාල පිරිසක් එකිනෙකා හා සමීපවන අන්දමේ තත්ත්වයක් ඇතිවීම නොවැලැක්විය හැකිය.

මේවන විට කොවිඩ්-19 වෛරස් වසංගතය මෙරට තුල පැතිරෙමින් පවත්නා තත්ත්වය සහ එය මැඩපැවැත්වීම සඳහා රජය විසින් ගෙන යන ක්‍රියාමාර්ගයන් ද (පාසල් සහ අනෙකුත් පොදු ස්ථාන වසා දැමීම, වැඩි වශයෙන් ජනතාව එක්රැස්වීම් සහ සංචරණ සීමාවන් ආදිය ද ඇතුළුව) විමසා බැලීමේදී, මෙම තත්ත්වය ඉදිරියේදී පැවැත්වීමට නියමිත මැතිවරණ දිනයේදී ඡන්දය භාවිතා කිරීමේ ප්‍රතිශතය කෙරෙහි දැඩි බලපෑමක් කරනු ඇතැයි නිරීක්ෂණය කලහැකි අතර ඡන්ද මධ්‍යස්ථානයන්හිදී පුද්ගලයින් එකිනෙකා හා සමීපව සිටීමට සිදුවීමෙන් උද්ගත වන බිය හේතුවෙන් ද ඡන්දදායකයින් අධෛර්යයට පත්වීමට හැකි බවට මැ.ප්‍ර.නි.ම විශ්වාස කරනු ලැබේ. මෙතුලින් උද්ගත වියහැකි තවත් ගැටළුකාරී තත්ත්වයක් වන්නේ ඡන්දදායකයින්ට ස්වකීය ඡන්දය නිදහසේ භාවිත කිරීමට මෙන්ම නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට ඇති ඉඩ ප්‍රස්ථා කෙරෙහිද අහිතකර ලෙස බලපෑමයි.

එමෙන්ම මෙම වසරේ මාර්තු සහ මැයි යන මාසයන්හි එංගලන්තයල ප්‍රංශයල ඉන්දියාව සහ ස්පාඤ්ඤය ආදී රටවල පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණ කිහිපයක් ද කොවිඩ්-19 වෛරස් වසංගත තත්ත්වය හේතුවෙන් කල්දමා ඇති බවද මැ.ප්‍ර.නි.ම මෙමගින් පෙන්වා දෙනු ලැබේ.

මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් ගත්කලල පාර්ලිමේන්තුව විසුරුවාහරිමින් මහ මැතිවරණයක් පැවැත්වීම සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කල අංක 2165/8 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය යළි කැඳවන ලෙසට ඉල්ලීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිල වශයෙන් සිදුකල හැකිය. විකල්පයක් වශයෙන් මැතිවරණය සඳහා නාමයෝජනා භාර ගැනීම අවසන් වූ පසුව නිකුත් කරනු ලබන ගැසට් නිවේදනය ඔස්සේ ඒකපාර්ශවිකව මැතිවරණය කල් දැමීම සඳහා බලය මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරේ.

ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ස්වකීය ඡන්දය සත්‍ය වශයෙන්ම නිදහස් හා සාධාරණ ආකාරයකින් භාවිත කිරීමට හැකි පසුබිමක වර්ෂ 2020 පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත්වීම තහවුරු කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධව කටයුතු කිරීමටත්ල ඒ හා සබැඳි කටයුතු වලදී ඕනෑම ආකාරයක සහයෝගයක් ලබාදීමටත් මැ.ප්‍ර.නි.ම සූදානමින් සිටින බව ද අවධාරණය කරනු ලැබේ.